# පුරවැසි අධ්‍යාපනය

## 11 ශ්‍රේණිය

### කාර්ය පත්‍රිකා සංග්‍රහය



**කලාප අධ්‍යාපන කාර්යාලය**

**අම්පාර**

**ගුරුභවතුනි,**

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සෑම විටම සිසුන් ක්‍රියාකාරීව තබා ගැනීමට ඔබ උත්සහ ගන්නවා ඇත. එයට හේතුව සාම්ප්‍රදායික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙන් මිදී නව ක්‍රමවේද පන්ති කාමරයට රැගෙන යාමයි. මේ නිසා ඔබගේ භූමිකාව කැපී පෙනෙන වෙනසකට පත්කරගෙන තිබීම පැසසිය යුතු වේ. එහෙත් අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත්ම පාර්ශව දෙක ශිෂ්‍යයා හා ගුරුවරයා මෑත කාලයේ රට ගිලගත් කොවිඩ් - 19 වසංගතය නිසා ඈත්කර තබා ඇත. මේ නිසා ඔබට බොහෝ දේ මඟ හැරී ඇත. එහෙත් පන්ති කාමරයෙන් බැහැරව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමට ඔබගත් උත්සහය අපමනය. මෙය ද ඔබට අත්වැලකි. දරුවන්ට ප්‍රයෝජනවත් ආකාරයෙන් මෙය භාවිතා කරන්න.

| ඒකකය | ඒකක අංකය |
|---|---|
| ➢ නීතිය හා යුක්තිය | 01 |
| ➢ ආණ්ඩුවේ විධ ස්තර | 02 |
| ➢ මානව හිමිකම් හා යුතුකම් | 03 |
| ➢ පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය | 04 |
| ➢ ජාත්‍යන්තර සම්බන්ධතා | 05 |



**දූ දරුවනි,**

ඔබගේ අධ්‍යයන කටයුතුවලට අත්වැලක් වශයෙන් අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලයේ සාමාජීය විද්‍යා **ඒකකය මඟින් ඒකක පරීක්ෂණ ගොනුවක් සකස් කර** සම්ප කර ඇත. ඔබගේ ශ්‍රේණියට අදාළ ව සෑම පාඩමක්ම ආවරණයවන ආකාරයට කර සකස් කර ඇති නිසා ඔබ ද මෙය ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගැනීමට උනන්දුවන්න.

# ඒකකය - නීතිය හා යුක්තිය

**ගුරුභවතාගේ නම : ආර්.සරත් රණවීර - අම්/සේනාගම මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 01**

## I කොටස

**01.**"නීතිය යනු පරමාධිපත්‍ය දේශපාලන අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන ආඥාවක් වන අතර එය කඩ කිරීම දඬුවමට හේතු වේ." මෙම නිර්වචනය ඉදිරිපත් කල චින්තකයා වන්නේ,

1.ටී.එම්. ග්‍රීන් 2. ඩබ්ලිව්. සියර්ඩ් 3. ජෝන් ඔස්ටින් 4. කිංඩල් බර්ග්

**02.** අපරාධ නීතියට ඇතුළත් වැරදි ක්‍රියාවක් වන්නේ,

1. මත්ද්‍රව්‍ය විකිණීම. 2. විවාහ සම්බන්ධ ගැටලු 3. ඉඩම් සම්බන්ධ ගැටලු 4. දේපළ සම්බන්ධ ගැටලු

**03.** මුස්ලිම් නීතිය අනුව නඩු විසඳීම සඳහා පිහිටුවා ඇති උසාවි වර්ගයකි කාතී උසාවිය. එය ආරම්භ කළ වර්ෂය වන්නේ,

1. 1706 2. 1806 3. 1978 4.1929

**04.** ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ ආයතනය වන්නේ,

1. මහාධිකරණය 2. අභියාචනාධිකරණය 3. මහේස්ත්‍රාත් අධිකරණය 4. ශ්‍රේෂ්ඨාධිකරණය

**05.** පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය හිමි අධිකරණ ආයතනය වනනේ,

1.ශ්‍රේෂ්ඨාධිකරණය 2.අභියාචනාධිකරණය 3.මහාධිකරණය 4.දිසාධිකරණය

**06.** නීතිය ක්‍රියාවට නංවන නිලධාරියකු නො වන්නේ,

1. අධිකරණ ඇමතිතුමා 2. අනු විනිශ්චයකාරතුමා
3. නීතිපතිතුමා 4. අධිකරණ සේවා කොමිෂමේ ලේකම්තුමා

**07.** නීතියේ ආධිපත්‍ය තහවුරු වූ සමාජයක දක්නට නො ලැබෙන ලක්ෂණයක් වන්නේ,

1.ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම. 3.නීතිය ඉදිරියේ සැමටම අසමාන ලෙස සැලකීම.
2.සාධාරණව හා අප්‍රවාදයට යුක්තිය පසිඳලීම. 4.නීතිය පිළිබඳ සැම පුරවැසියකුටම අවබෝධයක් තිබීම.

**08.** අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවරක් නො වන්නේ,

1.අධිකරණ සේවා කොමිසම ඇති කිරීම.
2.විනිශ්චයකරුවන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලක් ගෙවීම.
3.විනිශ්චයකරුවන් පත් කිරීමේදී දේශපාලන මැදිහත් වීම් සිදු කිරීම.
4.අධිකරණ නිලධාරීන් සඳහා වෙනත් තනතුරු ඉවත් කර තිබීම.

**09.** ඔම්බස්මන් හෙවත් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පත් කරනු ලබන්නේ,

1.අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින්. 3.අගමැතිවරයා විසින්.
2.අධිකරණ ඇමතිගේ උපදෙස් පිට ජනාධිපතිවරයා ය. 4.ජනාධිපතිවරයා විසින්.

**10.** වරදකරුවන්ව සිරගත හෝ මරණ දඬුවම ලැබ සිටින වැරදිකරුවන්ට සමාව දීමේ බලය හිමි පුද්ගලයා වන්නේ,

1. කතානායකවරයා 3. අධිකරණ ඇමතිවරයා
2. ජනාධිපතිවරයා 4. නීතිපතිවරයා

## II කොටස

01) I) සියලුම දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර, නීති පද්ධති ගුණාංග වලින් සම්පූර්ණ විය යුතුය. ඒ අනුව ඔබ දන්නා නීතියේ ගුණාංග 03ක් ලියන්න.

II) නීති ආරම්භ වීමට බලපාන නීති මූලාශ්‍ර රාශියකි. එවැනි මූලාශ්‍ර 02ක් ලියන්න

III) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතියට අමතරව ඇති වෙනත් විශේෂ නීති වර්ග 02ක් ලියන්න.

IV) දිසා අධිකරණයට විසඳිය හැකි නඩු වර්ග 03ක් ලියන්න.

V) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය ලියන්න.

02) I) ශ්‍රේෂ්ඨාධිකරණය සතු කාර්ය භාර්යන් 03ක් ලියන්න.

II) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය කෙටියෙන් පැහැදිලි කරන්න.

III) නීතිපතිතුමාගේ කාර්ය භාර්යන් 02ක් ලියන්න.

IV) නීතිපතිතුමාගේ කාර්යයන් ඉටු කිරීම සඳහා සහයවන නිලධාරීන් දෙදෙනෙක් ලියන්න.

V) අභියාචනාධිකරණය මගින් නිකුත් කරනු ලබන ආඥා වර්ග 02ක් ලියන්න.

03) I) ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම ඇත. ඉන් එක් ක්‍රමයකි බේරුම්කරණය. බේරුම්කරණය ප්‍රධාන කොටස් දෙකකි. එම කොටස් 02 ක නම් කරන්න.

II) ව්‍යවස්ථාව මගින් පිහිට වූ ඔම්බුඩ්ස්මන්වරයාගේ ප්‍රධාන කාර්යයන් ලියන්න.

III) ඔබ ප්‍රදේශයේ පිහිටුවා ඇති සමථ මණ්ඩල වෙත යෑමෙන් ඔබට ලැබෙන වාසි හා අවාසි 02ක් ලියන්න.

IV) මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් 03ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

04) I) රටක අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමේ වැදගත්කම කරුණු දෙකකින් ලියන්න.

II) එසේ සිදු නොවීමෙන් ඇතිවන අවාසි දායක තත්වය කරුණු දෙකකින් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) ඔබ නීති ගරුක පුරවැසියකු වශයෙන් ජීවත්වීමේ වැදගත්කම කරුණු දෙකකින් ලියන්න.

V) ඉන් එක් කරුණක් පැහැදිලි කරන්න.

05) I) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම යනු කුමක් ද? කරුණු 02න් පැහැදිලි කරන්න.

II) අධිකරණයේ විනිශ්චයකරුවන් ඉවත් කිරීම සඳහා විශේෂ ක්‍රම ස්ථාපනය කර ඇත. එම ක්‍රම වේද 02ක් ලියන්න.

III) අධිකරණ සේවා කොමිසම පිළිබඳ මූලික කාරණා දෙකක් ලියන්න.

IV) අධිකරණ නිලධාරීන් විශ්‍රාම යෑමෙන් අනතුරුව ද තවත් ධුරයන් නොදැරිය යුතුය. කරුණු දෙකකින් මෙය පැහැදිලි කරන්න.

V) අග්‍ර විනිශ්චයකාරතුමාගේ කාර්යය 03ක් ලියන්න.

# ඒකකය - ආණ්ඩුවේ විවිධ ස්තර

ගුරුභවතාගේ නම : ආර්.සරත් රණවීර - අම්/සේනාගම මහා විද්‍යාලය

කාර්ය පත්‍රිකා අංක 02

## I කොටස

**01.** ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයන් වන්නේ ය. මින් එවැනි රාජ්‍යක් නො වන්නේ,

1. ජපානය 2. පාකිස්ථානය 3. ඇමරිකා එක්සත් ජනපදය 4. නේපාලය

**02. 1833** ඇති කරන ලද කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව වූයේ,

1.15 2. 61 3. 225 4. 21

**03. 1931** ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු වූයේ,

1. ආණ්ඩුකාරවරයා හා අග්‍රාණ්ඩුකාරවරයා
3. නීති ලේකම් හා අගමැති
2. මුදල් ලේකම් හා රාජ්‍ය ලේකම්
4. මුදල් ලේකම් හා ආණ්ඩුකාරවරයා

**04.** ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක යුගල වන්නේ,

1.මොනරාගල හා පොළොන්නරුව
3.ගාල්ල හා මාතර
2.කෑගල්ල හා රත්නපුර
4.මොනරාගල හා බදුල්ල

**05.** රට සහා ක්‍රමය ශ්‍රී ලංකාවේ බලය බෙදීම සඳහා හඳුන්වා දුන්නේ කිනම් වර්ෂයේද ?

1.1957 2.1965 3.1978 4.1972

**06. 1978** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එහි ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව වන්නේය. එහි මූලික කාර්යයන් වන්නේ,

1.නීති පැනවීම.
3.නියෝග හා ආඥා පැනවීම.
2.රාජ්‍ය සේවය පාලනය
4.පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**07. 1978** ව්‍යවස්ථාව අනුව එහි මුළු සාමාජිකයන් ගණන **225** කි. එය දෙයාකාරයකින් පත්කර ගනී. එසේ පත් කර ගන්නා ආකාර දෙක වන්නේ,

1.මහජන ඡන්දයෙන් 200 ක් හා ජාතික ඡන්දයෙන් 25 ක්
2.මහජන ඡන්දයෙන් 175 ක් හා ජාතික ඡන්දයෙන් 50 ක්
3.මහජන ඡන්දයෙන් 196 ක් හා ජාතික ඡන්දයෙන් 29 ක්
4.මහජන ඡන්දයෙන් 29 ක් හා ජාතික ඡන්දයෙන් 196 ක්

**08. 1978** ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ විධායකය වන්නේ,

1.ජනාධිපති ඇතුළු කැබිනට් මණ්ඩලය
3.ජනාධිපති ඇතුළු කථානායකවරයා
2.අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය
4.ජනාධිපති ඇතුළු අගමැතිවරයා

**09.1972** ආණ්ඩුක්‍රමය යටතේ අග්‍රාණ්ඩුකාර ධුරය අහෝසි කර ඒ සඳහා ඇති කල ධුරය වන්නේ,

1.ජනාධිපති ධුරය
3.නීතිපති ධුරය
2.අගමැති ධුරය
4.ආණ්ඩුකාර ධුරය

**10.** මූලික අයිතිවාසිකම් ප්‍රථම වරට හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන්නේ,

1.1947 සොල්බරි ව්‍යවස්ථාව
3.1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
2.1972 පළමු ජනරජ ව්‍යවස්ථාව
4.1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

## II කොටස

01) I) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වාදුන් ප්‍රධාන යෝජනා 02ක් ලියන්න.

II) 1947 හඳුන්වාදුන් සොල්බරි ආණ්ඩුක්‍රමය මගින් ඇති කල ප්‍රධාන යෝජනා 02ක් ලියන්න.

III) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍යයේ කොමිෂන් සභාව ආයතන 02කට බෙදෙන ලදී. එම ආයතන 02 නම් කරන්න.

IV) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ ආයතනය ලියන්න.

V) 1972 ජනාධිපති පත් කළ ආකාරය ලියන්න.

02) I) උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක ලියන්න.

II) අනුරාධපුරය හා පොළොන්නරුව අයත් පළාත කුමක්ද?

III) ශ්‍රී ලංකාවේ පළාත් සභා ඇති කිරීමට අදාළ විධි විධාන මොනවා ද?

IV) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පිහිටුවා ගත් ආඥා පනත් 02 ලියන්න.

V) ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපාන හේතු 03 ලියන්න.

03) I) බලය විමධ්‍යගත කිරීමට යෑමේදී මතු වූ ගැටලු 03 ලියන්න.

II) ඉන් එකක් පැහැදිලි කරන්න.

III) ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල 02ක් ලියන්න.

IV) ව්‍යවස්ථාදායකය සතු බලතල 02ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

04) I) අධිකරණයේ ප්‍රධාන කාර්ය භාර්ය 02ක් ලියන්න.

II) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 03 ලියන්න.

III) මහ නගර සභා වලට පැවරී ඇති බලතල 02ක් ලියන්න.

IV) ඉන් එකක් පැහැදිලි කරන්න.

V) නගරාධිපතිවරයාගේ කාර්යයන් 03ක් ලියන්න.

05) I) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා 03කි. ඒවා මොනවා ද?

II) ඉන් එකක් පැහැදිලි කරන්න.

III) ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට පුරවැසි වගකීම් 03ක් ලියන්න.

IV) පුරවැසියා සමාජ සංවර්ධනවට දායක වන ආකාරය කරුණු 03 කින් ලියන්න.

V) වර්තමානයේ පරිසර කළමණාකරණය ඉතා වැදගත්ය. ඔබ පුරවැසියකු ලෙස එය ඉටු කරන ආකාරය කරුණු 02කින් ලියන්න.

# ඒකකය - මානව අයිතිවාසිකම් හා යුතුකම්

**ගුරුභවතාගේ නම : ආර්.සරත් රණවීර - අම්/සේනාගම මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 03**

**I කොටස**

**01.** මානව අයිතිවාසිකම් ප්‍රභල ලෙස කඩවුණු වකවානුවකි පළමු හා දෙවන ලෝක යුද්ධ කාලය. එම වකවානුව වන්නේ,

1. 1914– 1918 හා 1939 – 1945
2. 1910– 1920 හා 1900 – 1910
3. 1950– 1955 හා 1945 – 1948
4. 1915 – 1919 හා 1930 - 1940

**02.** ලෝක සාමය ආරම්භ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කළ වර්ෂය වනුයේ,

1. 1955 2. 1945 3. 1925 4.1950

**03.** ළමයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු හතරක් මුල් කොට සිදු කරයි. ඒවායෙන් එක් අරමුණක් වනුයේ,

1. ආහාර 2. සංවර්ධනය 3. ඇඳුම් පැළඳුම් 4. අධ්‍යාපනය

**04.** ශ්‍රී ලංකාවේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති අණ පනතක් නො වන්නේ,

1. සේවක අර්ථසාධක අරමුදල් පනත
2. කාර්මික ආරවුල් පනත
3. ප්‍රයුති ආධාර පනත
4. උසස් අධ්‍යාපන පනත

**05.** ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ආයතනයක් නො වන්නේ,

1. මධ්‍යම පරිසර අධිකාරිය
2. වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව
3. වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තුව
4. වාරි මාර්ග දෙපාර්තුමේන්තුව

**06.** පාසල් සාමාජිකයකු ලෙස ඔබෙන් ඉටු විය යුතුකමක් නො වන්නේ,

1. විනය ගරුක වීම.
2. ගුරුවරුන්ට කීකරු වීම.
3. පාසලේ ඇති සම්පත් අයතා පරිහරණය.
4. අධ්‍යාපන කටයුතු හොඳින් කර ගෙන යාම.

**07.** වර්තමානයේ මූලික අයිතිවාසිකම් වල ආරක්ෂකයා ලෙස මූලික ව කටයුතු කරන ආයතනය වන්නේ,

1. ආණ්ඩුව 2. ශ්‍රේෂ්ඨාධිකරණය 3. ජනමාධ්‍ය 4. පළාත් පාලන ආයතනය

**08.** මානව හිමිකම් කොමිෂන් සභාව මඟින් ද මානව අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලබයි. එසේ කරනු ලබන කාර්යයක් නො වන්නේ,

1. මානව අයිතීන් උල්ලංඝනය පිළිබඳ විමර්ශන වාර්තා ලබා දීම.
2. මේ සම්බන්ධයෙන් පුරවැසියන් දැනුවත් කිරීම.
3. ජාතික අධ්‍යාපන ආයතන මගින් පාසල් පද්ධතියට ඇතුළත් කිරීම.
4. දේශපාලන පක්ෂ මගින් මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම

**09.** අප විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගෞරවය ආරක්ෂා කළ යුතු වන්නේය. ඒ සඳහා අප කළයුතු කාර්යක් නො වන්නේ,

1. ඔවුන්ගේ නිදහස ආරක්ෂා කිරීම.
3.ස්වාධීනත්වය සුරකීම.
2. රැකවරණය සැලසීම.
4.අවිධිමත් රැකියාවල නො යෙදීම.

**10.** ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව හඳුන්වා දීමට භාවිතා කරන නම වනුයේ,

1. ගෝත්‍රික ජනතාව 2. වැදි ජනතාව 3. විදේශිකයන් 4. ධීවර ජනතාව

## II කොටස

01) I) මානව හිමිකම් පිළිබඳ මූලික අදහස් 02 ලියන්න.

II) මානව හිමිකම් දිනා ගැනීමට වැදගත් ඓතිහාසික අවස්ථා 02 ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) මානව හිමිකම් ආරක්ෂා කරන ප්‍රධාන ලියවිල්ල කුමක්ද?

V) වර්තමානයේ ඔබ විසින් භුක්ති විඳින අයිතිවාසිකම් 03ක් ලියන්න.

02) I) මානව අයිතිවාසිකම් ප්‍රධාන වර්ග 02 ලියන්න.

II) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් 03ක් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) මරණ දඬුවමට සම්බන්ධව ඇති සම්මුතීන් 02ක් ලියන්න.

V) කාන්තා අයිතිවාසිකම්වල වැදගත්කම කාරණා 02කින් ලියන්න.

03) I) ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර 02ක් ලියන්න.

II) ශ්‍රී ලංකාවේ ළමා අයිතිය කඩවන අවස්ථා 03 ක් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) ළමා අයිතිවාසිකම් සම්මුතියෙන් සම්මත කර ඇති අයිතිවාසිකම් රාශියකි. ඉන් තුනක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

04) I) ළමයාගේ උපරිම යහපත සැලසීම සඳහා රජයන් වෙත පවරා ඇති අයිතිවාසිකම් රාශියකි. ඉන් තුනක් ලියන්න.

II) ශ්‍රී ලංකාවේ මේ සඳහා ගෙන ඇති පියවර 02ක් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර 02ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

05) I) කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ලෙස ගෙන ඇති පියවර 02ක් ලියන්න.

II) ශ්‍රී ලංකාවේ පරිසරයආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන 03ක් ලියන්න.

III) රැකියාවක නියුක්ත වීමේදී ඔබ ඉටු කළ යුතු යුතුකම් 02ක් ලියන්න.

IV) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවුලේ සමාජිකයකු ලෙස ඔබ ඉටු කළ යුතුකම් 03ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

# ඒකකය - පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය

**ගුරුභවතාගේ නම : ආර්.සරත් රණවීර - අම්/සේනාගම මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 04**

## I කොටස

**01. ජලය දූෂණය වන ස්වාභාවික අවස්ථාවක් නො වන්නේ,**

1. සුනාමි අවස්ථා. 2. භූමි කම්පා සිදු වීම්. 3. ගිනි කඳු ක්‍රියාකාරීත්වය. 4. යාන වාහන සේදීම.

**02. ජලය දූෂණයෙන් ඇති වන ගැටලුවක් නො වන්නේ,**

1. ජලජ ජීවීන් මිය යාම.
3. පිරිසිදු ජලය මිලදී ගැනීමට විශාල පිරි වැයක් යෙදීමට සිදු වීම.
2. පාරිසරික සුන්දරත්වය විනාශ වීම.
4. ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු වීම.

**03. මිනිස් ක්‍රියාකාරකම් නිසා ශිලා ගෝලයට සිදුවන බලපෑමක් වන්නේ,**

1. ජල මූලාශ්‍රයන් විනාශ වී යාම.
2. ජලජ ජීවීන් මිය යාම.
3. කෘෂිකාර්මික කටයුතු අඩාල වීම.
4. ජල චක්‍රයට බාධා ඇති වීම.

**04. වායු දූෂණය වන කෘතිම අවස්ථාවක් නො වන්නේ,**

1. කර්මාන්ත ශාලාවලින් පිටවන දුම්.
2. ප්‍රවාහන කටයුතු නිසා.
3. ගුවන් යානා භාවිතය.
4. ගිනි කඳු ක්‍රියාකාරීත්වය.

**05. දේශගුණික වෙනස් වීම් නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් නො වන්නේ,**

1. වර්ෂාපතන ක්‍රියාවලිය වෙනස්වීම.
2. කෘෂි අස්වනු අඩු වීම.
3. ජලජ ශාක හා සත්ත්ව ප්‍රජාව මිය යාම.
4. සාගර ජල මට්ටම ඉහළ යාම.

**06. සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික මිනුමක් වනුයේ,**

1. ආරම්භ වර්ධක වේගය.
2. හරිත දළ දේශීය නිෂ්පාදන.
3. දූරකථන සනත්වය.
4. මානව සංවර්ධන දර්ශනය.

**07. භෞතික ජීවන තත්ව දර්ශනයට අයත් දර්ශකයක් වන්නේ,**

1. අන්තර්ජාල භාවිතය. 2. උපතේ දී ආයු අපේක්ෂාව. 3. ආර්ථික වර්ධන වේගය. 4. දූරකථන සනත්වං

**08. සංවර්ධනය වන රටවල ලක්ෂණයක් නො වන්නේ,**

1. තාක්ෂණය අඩු භාවිතය.
2. ඒක පුද්ගල ආදායම ඉහළය.
3. ළදරු මරණ අනුපාතය.
4. විදේශ විනිමය ඉපයීම.

**09. සංවර්ධිත රටවල ලක්ෂණයක් වන්නේ,**

1. කාර්මික දායකත්වය වැඩි වීම.
3. ඒක පුද්ගල ආදායම පහළ ය .
2. ජන සංවර්ධන වේගය වැඩි වීම.
4. එක් වෛද්‍යවරයෙකුට සිටින රෝගී සංඛ්‍යාව වැඩිය.

**10. සංවර්ධිත රටවල් මුහුණ පාන ගැටලුවක් වන්නේ,**

1. ප්‍රාග්ධන ඌනතාවය.
2. අවාසිදායක වෙළඳ ශේෂය.
3. අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුව.
4. තාක්ෂණය අඩු භාවිතය.

## II කොටස

01) I) පරිසරය අර්ථ දැක්වීම සඳහා නිර්වචනයක් ලියන්න.
II) පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක සඳහන් කරන්න.
III) ස්වාභාවික පරිසරයට ඇතුළත් සංසිද්ධීන් 03ක් ලියන්න.
IV) ආර්ථික උපකාරක සේවා යන්න හඳුන්වා දී උදාහරණ 02ක් ලියන්න.
V) පාරිසරික ගැටලු නිසා සිදු වන සමාජීය බලපෑම් 03ක් ලියන්න.

02) I) ජලය දූෂණය සිදු වන අවස්ථා 03ක් ලියන්න.
II) ජලය දූෂණය වීමෙන් ඇති වන ගැටලු 03 ලියන්න.
III) ඉන් එකක් පැහැදිලි කරන්න.
IV) ශිලා ගෝලයට සිදු වී ඇති බලපෑම් 03ක් ලියන්න.
V) ඉන් එකක් පැහැදිලි කරන්න.

03) I) වන විනාශය නිසා සිදුවී ඇති අහිතකර බලපෑම් 03ක් ලියන්න.
II) වන සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි පියවර 02ක් ලියන්න.
III) වායු දූෂණය සිදු වන අවස්ථා 03ක් ලියන්න.
IV) වායු දූෂණය නිසා සිදු වී ඇති අහිතකර බලපෑම් 03ක් ලියන්න.
V) ඉන් එකක් පැහැදිලි කරන්න.

04) I) දේශගුණික වෙනස් වීම් නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 02ක් ලියන්න.
II) ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල 02ක් ලියන්න.
III) ඉන් එකක් පැහැදිලි කරන්න.
IV) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් 03ක් ලියන්න.
V) ඉන් එකක් පැහැදිලි කරන්න.

05) I) සංවර්ධනය මැනීමට සඳහා භාවිත කරන දර්ශක 02ක් ලියන්න.
II) සංවර්ධනය වෙමින් පවතින රටවල ගැටලු විසඳා ගැනීම සඳහා ගත හැකි පියවර 02ක් ලියන්න.
III) ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජය ගැනීමට ගත හැකි පියවර 02ක් ලියන්න.
IV) තිරසර සංවර්ධනය සඳහා ගත හැකි පියවර 02ක් ලියන්න.
V) තිරසර සංවර්ධනයේ දී රාජ්‍යයේ වගකීම් 02ක් ලියන්න.

# ඒකකය - ජාත්‍යන්තර සම්බන්ධතා

**ගුරුභවතාගේ නම : ආර්.සරත් රණවීර - අම්/සේනාගම මහා විද්‍යාලය**

**කාර්ය පත්‍රිකා අංක 05**

## I කොටස

**01.** **ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වන ආකාරයක් නො වන්නේ,**

1. රාජ්‍ය රාජ්‍ය අතර
2. පුද්ගල පුද්ගලයන් අතර
3. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර
4. රාජ්‍ය හා පුද්ගලයන් අතර

**02.** **සාර්ක් සංවිධානයේ සමාජික රටක් නො වන්නේ,**

1. මැලේසියාව 2. ඉන්දියාව 3. නේපාලය 4. මාල දිවයින

**03.** **එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනයක් වන්නේ,**

1. කොළඹ ක්‍රමය
2. ආරක්ෂක මණ්ඩලය
3. ජාතජාත්‍යන්තර මූල්‍ය අරමුදල
4. ලෝක බැංකුව

**04.** **එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනයක් වන්නේ,**

1. ලෝක සෞඛ්‍ය සංවිධානය
2. මහ ලේකම් කාර්යාලය
3. ආරක්ෂක මණ්ඩලය
4. ජාත්‍යන්තර අධිකරණය

**05.** **ජාත්‍යන්තරව භාවිත වන ප්‍රබලම මුදල් ඒකකය වන්නේ,**

1. ඉන්දීය රුපියල්
2. ජපානයේ යෙන්
3. රුසියාවේ රූබල්
4. ඇමරිකා එක්සත් ජනපදයේ ඩොලර්

**06.** **සාර්ක් සංවිධානය ආරම්භ කිරීමට මූලික වූ රාජ්‍ය නායකයා වන්නේ,**

1. ශ්‍රී ලංකාවේ ජේ.ආර්. ජයවර්ධන මහතා
2. ඉන්දියාවේ රජිව් ගාන්ධි
3. බංගලාදේශයේ සියා උර් රහමාන්
4. පකිස්ථානයේ බෙනාසීර් භූතෝ

**07.** **සාර්ක් සංවිධානයේ අවසන් වරට සාමාජිකත්වය ලබා ගත් රාජ්‍ය වන්නේ,**

1. ශ්‍රී ලංකාව 2. ඉන්දියාව 3. පකිස්ථානයේ 4. ඇෆ්ගනිස්ථානය

**08.** **තානාපතිවරයෙකුගේ කාර්ය භාර්යක් නො වන්නේ,**

1. තම රටේ ප්‍රතිපත්ති අවබෝධ කර දීම.
2. රාජ්‍ය අතර මිත්‍රත්වය වැඩි දියුණු කිරීම.
3. තම රටේ විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
4. තම රටේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම.

**09.** **ලෝක සෞඛ්‍ය සංවිධානය ආරම්භ කල වර්ෂය වන්නේ,**

1. 1948 2. 1944 3. 1945 4. 1950

**10.** **ශ්‍රී ලංකාවට විදේශ ආධාර සපයන සංවිධානයක් නො වන්නේ,**

1. ලෝක බැංකුව
2. ආසියානු සංවර්ධන බැංකුව
3. ඇමරිකා එක්සත් ජනපදය
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

## II කොටස

01) I) ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත් වන ආකාරය කරුණු 02 කින් ලියන්න.

II) ඉන් එකක් පැහැදිලි කරන්න.

III) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වී ඇති ක්ෂේත්‍ර 03 ලියන්න.

IV) ඉන් එකක් පැහැදිලි කරන්න.

V) ජාත්‍යන්තර සම්භන්ධතා වර්ධනය වීමට බලපාන සාධක 02ක් ලියන්න.

02) I) ණය ආධාර සැපයීමේදී නොයෙකුත් බලපෑම් ඇති කරයි. ශ්‍රී ලංකාවට ඇති බලපෑම් 02ක් ලියන්න.

II) සාර්ක් සංවිධානයේ අරමුණු 02ක් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) සාර්ක් සංවිධානය අත්සන් කර ඇති වෙළඳ ගිවිසුම් 02ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

03) I) කොළඹ ක්‍රමයේ සාමාජික රටවල් 02ක් ලියන්න.

II) එමඟින් ලැබෙන සේවාවන් 02ක් ලියන්න.

III) එක්සත් ජාතීන්ගේ අරමුණු 02ක් ලියන්න.

IV) එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන 03ක් ලියන්න.

V) ඉන් එකක් පැහැදිලි කරන්න.

04) I) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ අරමුණු 02ක් ලියන්න.

II) ලෝක ආහාර වැඩසටහනේ අරමුණු 02ක් ලියන්න.

III) විදේශ ආධාර ලැබෙන ප්‍රධාන ආකාර 02 ලියන්න.

IV) අන්තර් ජාතික වෙළඳාමේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.

V) විදේශ වෙළඳාම සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන 02 ලියන්න.

05) I) වර්තමානයේ ශ්‍රී ලංකාවට විදේශ ආධාර ලබාගන්නා ව්‍යාපෘති 02 ක් ලියන්න.

II) ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන යහපත් ප්‍රතිඵල 02ක් ලියන්න.

III) ඉන් එකක් පැහැදිලි කරන්න.

IV) ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අයහපත් ප්‍රතිඵල 02ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න.